සැබැවින්ම මෙය දේවස්ථානයයි. මූත්රා කිරීම වැනි දෙයක් හෝ අපවිත්ර දෙයක් හෝ මෙහි සිදු කිරීම සුදුසු නැත. සැබැවින්ම මෙය සර්වබලධාරී අල්ලාහ්ව මෙනෙහි කිරීම සඳහාත් සලාත් ඉටු කිරීම සඳහාත් අල්-කුර්ආනය පාරායනය කිරීම සඳහාත් වන ස්ථානයකි

අනස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: අපි අල්ලාහ්ගේ
දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) සමග මස්ජිදයේ සිටිය දී ගැමි අරාබිවරයකු
පැමිණ සිටගෙන මස්ජිදයේ මූත්රා කරන්නට විය. එවිට අල්ලාහ්ගේ දූතයාණන්ගේ සහගාමීහු: "හෝ ! හෝ !" යැයි කෑ ගැසූහ. අල්ලාහ්ගේ දූතයාණෝ: "ඔහුව නොවළක්වන්න. ඔහුව අත්හැර දමන්න" යැයි පැවසූහ. ඔහු මූත්රා කරන තෙක් ඔවුහු ඔහුව අත්හැර දැමූහ. පසුව අල්ලාහ්ගේ දූතයාණන් ඔහු අමතා ඔහුට මෙසේ පැවසූහ: "සැබැවින්ම මෙය දේවස්ථානයයි. මූත්රා කිරීම
වැනි දෙයක් හෝ අපවිත්ර දෙයක් හෝ මෙහි සිදු කිරීම සුදුසු නැත. සැබැවින්ම මෙය සර්වබලධාරී අල්ලාහ්ව මෙනෙහි කිරීම සඳහාත් සලාත් ඉටු කිරීම සඳහාත් අල්-කුර්ආනය
පාරායනය කිරීම සඳහාත් වන ස්ථානයකි." අල්ලාහ්ගේ දූතයාණන් මෙසේ පවසා සිටි අතරම එම පිරිසේ සිටි මිනිසෙකුට ජල බදුනක් ගෙන එන්නට නියෝග කර එහි වක් කරන මෙන් අණ කළහ.
[صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මස්ජිදයේ තම සහගාමීන් සමග සිටිය දී ගැමි අරාබිවරයකු පැමිණ මස්ජිදයේ කොණක මූත්රා කරන්නට විය. එවිට සහගාමීහු: "හෝ නතර කරනු! ඉන් වැළකෙනු!" යැයි කෑ ගසා පලවා හරින්නට වූහ. එවිට (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ: "ඔහු මූත්රා කිරීම නොවළක්වන්න. ඔහු එය අවසන් කරන තුරු අත්හැර දමන්න" යැයි පැවසූහ. පසුව අල්ලාහ්ගේ දූතයාණන් ඔහු අමතා ඔහුට මෙසේ පැවසූහ: "සැබැවින්ම දේවස්ථාන වනාහි, ඒවායෙහි මූත්රා කිරීම වැනි දෙයක් හෝ අපවිත්ර දෙයක් හෝ සිදු කිරීම සුදුසු නැත. සැබැවින්ම ඒවා සර්වබලධාරී අල්ලාහ්ව මෙනෙහි කිරීම, සලාත් ඉටු කිරීම හා අල්-කුර්ආනය පාරායනය කිරීම වැනි කටයුතු සඳහා වන ස්ථාන වේ." පසුව සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ සහාබාවරුන් අතරින් කෙනෙකුට ජල බදුනක් ගෙන එන්නට නියෝග කර එහි වක් කරන මෙන් අණ කළහ.

http://sunnah.global/hadeeth/si/show/8948